# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/19 – 2022 ජූලි මස 20 වැනි බදාදා – 2022.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 127 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/3/2021/VE/174.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/ඉ.අත්/200.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 ජුනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, සීතාවක.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 431/සී, පුවක්පිටිය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පුවක්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/HNW/2021/673 හා 2021.12.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – එල්ස්ටන්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2833**

උතුරට: පාර සහ ප්‍රගතිපුර නිවාස යෝජනා ක්‍රමය; නැගෙනහිරට: ප්‍රගතිපුර නිවාස යෝජනා ක්‍රමය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන එල්ස්ටන්වත්ත; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන එල්ස්ටන්වත්ත; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන එල්ස්ටන්වත්ත, ප්‍රගතිපුර නිවාස යෝජනා ක්‍රමය සහ පාර.

EOG 07 – 0103

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 130 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/09/2020/BOI/133.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DIVKW/LND/ACQUI/4/BOI/2.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 ජූනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, උඩුබද්දාව.

2. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1484, වතුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වතුවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/UDB/2021/246 හා 2021.11.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් හයට (06) මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කොහිලමුල්ලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0041 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත; දකුණට: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත සහ කැබලි අක්ෂර B; බටහිරට: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත.

02. **කැබලි අක්ෂර 'B' – ප්‍රමාණය: හෙක්. 0.0587 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර A සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත; නැගෙනහිරට: මාර්ගය, කැබලි අක්ෂර F, C සහ D; දකුණට: මාර්ගය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත සහ කැබලි අක්ෂර E; බටහිරට: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත, කැබලි අක්ෂර E සහ A.

03. **කැබලි අක්ෂර 'C' – කොහිලමුල්ලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.4607 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර B සහ D; නැගෙනහිරට: කැබලි අක්ෂර B, මාර්ගය, කැබලි අක්ෂර F සහ D; දකුණට: කැබලි අක්ෂර F, D, B සහ මාර්ගය; බටහිරට: කැබලි අක්ෂර B සහ D.

04. **කැබලි අක්ෂර 'D' – ප්‍රමාණය: හෙක්. 0.0209 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර B සහ C; නැගෙනහිරට: කැබලි අක්ෂර C සහ F; දකුණට: කැබලි අක්ෂර F සහ C; බටහිරට: කැබලි අක්ෂර C සහ B.

05. **කැබලි අක්ෂර 'E' – කොහිලමුල්ලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0456 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට සහ බටහිරට: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත.

06. **කැබලි අක්ෂර 'F' – කොහිලමුල්ලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1012 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර B, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හිමිකම් කියන වතුවත්ත *නොහොත්* ජර්මන්වත්ත සහ මාර්ගය; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: කැබලි අක්ෂර B, C සහ D.

EOG 07 – 0104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.